ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය




මුලු නිවසම විශාල පාලුවකින් පිරී ඇති බවක් දිලීපට දැනුණි. නිෂාධි කොහේ ගියාදැයි ඔහු නොදැන සිටියේ ය. මේ නිවසේ සියලු ආධිපත්‍යය තමන් වෙතින් ගිලිහී ගොස් ඇති බව ඔහුට දැනෙයි. මේ තාක් කාලයක් තමා කිසිදු අභියෝගයකට ලක් නොවී පවත්වාගෙන ගිය දැඩි ආධිපත්‍යය සිතිය නොහැකි තරම් කෙටි කාලයක දී බිඳ වැටී ඇත.

ඔහු කීප වරක්ම නිෂාධිගේ ජංගම දුරකතනයට ඇමතුමක් ගන්නට උත්සාහ කළ නමුත් එය අසාර්ථක විය. ඇය දුරකතන ක්‍රියා විරහිත කොට ඇතැයි ඔහු අනුමාන කළේ ය.

තේ කෝප්පයක් බොන්නට ඇත්නම් මැනැවැයි ඔහුට සිතුණි. පෙර දී නම් මෙවැනි වේලාවට ඔහු කරන්නේ ''නිෂා තේ එකක්..'' යයි කෑගැසීම පමණකි. දැන් තමා වෙනුවෙන් එවන් දෙයක් කර දෙන්නට කිසිවකු නැත.

මේ නිවසේ සියළු වැඩ කටයුතු කෙරුණේ ඇගේ අතින් නොවේ ද..? තමා කළේ විධානයන් දීම පමණක් නොවේ ද..? කිසිදු දිනෙක මුවින් මැසිවිල්ලක් නොනගා ඈ මේ නිවස තුළ සිරකාරියක්ව සිටියා නොවේ ද? පොත පතින් බැහැර ජීවිතය පිළිබඳ තමාගේ වැටහීමේ යම් අඩුවක් තිබේ ද..? මේ සියල්ල මේ ආකාරයට සිදුවූයේ කෙසේ ද? දිලීප ට සිතන්නට බොහෝ දේ තිබුණි. මේ සියල්ල තමාට පෙර දී නොවැටහුණේ මන්දැයි ඔහු තමාගෙන්ම ප්‍රශ්න කර ගත්තේ ය.

තේ බීමේ අදහස මොහොතකට ඉවත් කරගත් දිලීප මුලුතැන් ගෙයි කබඩයෙන් ගත් මත්පැන් බෝතලයෙන් වීදුරුවක් වත්කර ගත්තේ ය. නිෂාධිගේ වාහනය වත්තට ඇතුල් වුණේ ඔහු දෙවන මත්පැන් වීදුරුව අවසන් කරන අතරදී ය. ඉදිරිපස දොර ඇර නිවසට ඇතුල් වූ නිෂාධි දිලීප දෙසත් ටීපෝව මත වූ මත්පැන් බෝතලය දෙසත් බැලුවා ය.

''කො.. හෙ.. ද.. ගියේ..?'' ඔහු තදින් ඇසුවේ ය.

සාලය මැද නැවතුණ නිෂාධි දිලීප දෙස එක එල්ලේ බැලුවා ය. ඇගේ දෑසේ රැඳුණු දැඩි බැල්ම ඔහු පසුබස්වන්නට තරම් රළු විය. මුවින් පිළිතුරක් නොදුන්න ද ඇගේ බැල්ම ඔහුට පිළිතුරක් දුන්නා සේ ම විය. ඔහු එක වරම මත්පැන් වීදුරුවේ ඉතිරිය මුවට හලා ගත්තේ ය. ඔහු එසේ කළේ තමා රිදවන්නට බව නිෂාධිට වැටහෙයි. පෙර කලෙක ඔහු එසේ කළා නම් ''අනේ දිලීප.. එපා .. එපා''යි තමා බැගෑපත්වනු ඇති බව නිෂාධිට විශ්වාස ය. සබඳකම් බිඳී ගිය පසු හැඟීම් ලෙස කිසිවක් ඉතිරි නොවන බව ඇයට දැන් වැටහෙයි. සිතින් ඈත් වූ පසු ඉතිරි වින්නේ අනුකම්පාව පමණක්ම නොවේ ද? ඒ අනුකම්පාවෙන් ඇති ඵලය කුමක් ද?

''කො.. හෙ.. ද.. ගියේ..?'' ඔහු නැවත ඇසුවේ ඇගේ මුහුණ දෙස නොබලමිනි. දෙවන වතාවටද ඇසුව ද ඇය පිළිතුරක් නොදෙන බව ඔහු දැන සිටියේ ය. එනමුදු ඇය ඉදිරියේ පසුබට වන්නට සිතක් ඔහුට නොවී ය.

දිලීප බෝතලයෙන් තවත් වතාවක් වීදුරුවට මත්පැන් වත් කර ගත්තේ ය. නිෂාධි ඒ දෙස මොහොතක් බලා සිට සිය කාමරයට වැදුණා ය. බෝතලයක් පෙරළෙන හඬ ඇඳේ ඇලවී සිටි ඇයට ඇසුණි.

000000000

''ඊයෙ ගෙදර මොකක් හරි ප්‍රශ්නයක් වුණා ද..?'' සඳලි ඇසුවේ දිලීප ඉදිරියේ අසුන් ගන්නා අතරදී ය. ''මූණත් එක්ක ඇදිලා ගිහින්.. නිදි මැරුවද..?''

*රන් පාටින් ඉර පායා තිබු හින්දා*
*රන් සඳවතිය උන්නා සිත වට බන්දා*
*රන් වන් නදී ගලනා මදනළ රන්දා*
*රන් තරු පොකුරු සැඟවුණි මා සිත බින්දා*

*රූ සිරි සොබා සිත පොබ කළ මනාවන්*
*ආ සිරි ගෙනා කුමරිය පෑ සිනාවන්*
*රූ සිරි අඟෙයි යළි යළි වාසනාවන්*
*ආ සිරි ගෙනෙමි සුරකුමරිය ප්‍රියාවන්*

සඳලිගෙ ප්‍රශ්නය නෑසුනාක් මෙන් දිලීප ගැඹුරු කල්පනාවක නිමග්නව සිටී. අතීතයේ සොඳුරු දසුන් ඔහු සිත පුරා මැවී යයි. තමාම මෙයට වරදකරු යැයි ඔහුට තදින්ම දැනෙන්නට විය. ඇගේ ප්‍රශ්නයට දිය හැකි පිළිතුරක් දිලීපගේ සිතට නොආවේ ය. ඊයේ බිව් මත්පැන් වල සැරට තවමත් හිස ද තෝන්තු වී ඇතිවා සේ දැනෙයි. සඳලි ඉක්මනින් යනවා නම් හොඳ ය. එවිට මේසයට හිස ගසාගෙන නිදා ගන්නට හැකි ය.

''නොකියන හුඟක් දේ තේරුම් ගන්න පුළුවන්..'' සඳලි නැවත කීවා ය.

ඔහු පුටුවෙන් නැගිට ජනේලය අසළට ගියේ ය. නොඋස් ගොඩනැගිලි වලට ඔබ්බෙන් ඈතින් පෙනෙන නගරය දෙස ඔහු නිහඬව බලා සිටියේ ය. නගරයට ඉහළ අහසේ විවිධ හැඩයෙන් හා විවිධ වර්ණයෙන් යුත් බැලුන කීපයක් පාවෙමින් තිබෙනු ඔහුට පෙනුණි.

සඳලි ඔහු පිටුපසින් සිටගනු ඔහුට දැනුණි.

''දිලීප..'' ඈගේ සිහින් හඬ ඔහුට ඇසුණි. ''මට ඔයා ගැන දුකයි දිලීප..''

ඔහු ආපසු හැරුණේ ය. තමාට අඩියක් දුරින් ඇගේ දෑස් දැල්වෙමින් තිබෙනු ඔහුට පෙනුණි.

''I really really feel sorry for you"'' ඈ සෙමින් මිමිණුවා ය. ඈ හෙලූ සුසුම ඔහුගේ මුහුණ මත වැදුණි. ඔහු ඈ වෙතින් ඉවත් වන්නට හැරුණේ ය. ඈ සිය දෑත ඔහුගේ උරහිස් මත තබා ඔහු වැළැක්වූවා ය.

''දුවන්න හදන්න එපා.. මං ඔයාගෙ ඇඟට පනින්නෙ නෑ..'' ඈ කීවේ සිනාසෙන්නට උත්සාහ කරන අතරදීය. ''මට කියන්න.. ඔයාටත් ආරංචි වුණා ද..? ඕක නේද ප්‍රශ්නෙ..''

ඔහු ප්‍රශ්නාර්ථයක් රැඳුන මුහුණින් ඈ දෙස බැලුවේ ය.

''මොකක් ද..?'' ඔහු මඳ වේලාවකට පසුව ඇසුවේ ය.
''ඇයි..? ඔයා දන්නෙ නැද්ද..?''
''මොකක් ද..?''

''අනුරාධ මෙල්බන් එනවා කියලා ඔයා දැනගත්තෙ නැද්ද..?'' ඈ ඇසුවේ පුදුමයෙනි.
''කොහෙ දැනගන්න ද..? මෙයා ඉතින් වෙනම ලෝකෙක ජීවත් වෙන මනුස්සයෙක්නෙ..'' ඈ දෙවෙනුව කීවා ය.
ඒ ප්‍රවෘත්තියෙන් සසළ වුව ද එය නොපෙන්වා සිටින්නට ඔහු උත්සාහ ගත්තේ ය. ''ඉතිං මොක ද?'' ඔහු ඇසවේ එනිසා ය.

ඈ කොක් හඬදී සිනාසුණා ය.

''කලබල වුණේ නෑ කියලා පෙන්නන්න හැදුවට ඔයාගෙ ඇස් වලින් මට ඇත්ත පේනවා මහත්තයා..'' ඈ සිනාසෙන අතරදීම කීවා ය.

ඔහු ඇයට පිටුපා ගොස් සිය අසුනෙහි වාඩි වූයේ ය.

''මේ අහන්න.. මල්වැස්ස ෆිල්ම් එක ගෙන්නනවා ලබන මාසෙ.. ගාල්ල හොස්පිට්ල් ප්‍රොජෙක්ට් එකට ෆන්ඩ්ස් රේස් කරන්න.. ඒකෙ ගෙස්ට්ලා හැටියට ෆිල්ම් එකේ ඩිරෙක්ටරුයි අනුරාධයි මනීෂයි එනවා.. මනීෂා කියන්නෙ ඒ ෆිල්ම් එකේ මේන් ඇක්ට්‍රස්..''

''ඒ මිනිස්සු එන්නෙ මොකට ද?''

''අයියෝ. ඔයා නම් වැඩක්ම නැති මනුස්සයෙක් දිලීප.. අනුරාධ කිව්වම කෙල්ලෝ පොරකනවා දැකගන්ඩ.. මනීෂාට කොල්ලෝ පොරකනවා.. ඉතින් ටිකට්ස් ටික ලේසියෙන්ම විකුණාගන්න

NEED TO GET THE MOST OUT OF YOUR MONEY?
CALL US TODAY (03) 9654 1903 ALL BANKS AND NON BANKS - WE DEAL

**Home/Investment/Business Loans**
*Home Purchase (100%)
*Investment Property (100%)
*Consolidate all your debts into 1 monthly payment
*Personal loans up to 70k
*Car loan / lease
Refinance and release your Home Equity (up to 95% of the value of your home)

**Migration:**
Business
Employer
Skilled migration
Family Members
Humanitarian
Regional australia
Special Category

**Conveyancing:**
Buying
Selling
House and Land
commercial
Business
Old Law
Strata Stratum



RUDY FRUGTNIET
LL,B, LL,M, GDLP, MMIA
Registered Migration Agent
No: 9686142

Level 1, Suite 1B
The Paramount Centre
108 Bourke Street
Melbourne 3000
GPO Box 959 Melbourne
Vic 3001

OBLIGATION FREE APPRAISAL
Tel: (03) 9654 1903 Fax: 9654 9806 Mob: 0410 027 105
www.mortgageandmigration.com.au
Email: uniquemortgage@netlink.com.au
frugtnic@aapt.net.au